## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදල - 2016

-------------------------------------------------------------------

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** මතය

මූල්‍ය ප්‍රකාශන වලින් **2016** දෙසැම්බර් **31** දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1** ගිණුම්කරණ අඩුපාඩු

ඉකුත් වර්ෂයේදී ගෙවිය යුතු දායක මුදල් රු. **75,948** ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සන්සන්දනාත්මක සටහන් දැක්වීමේදී ගෙවිය යුතු පොලී ලෙස දක්වා තිබුණි.

**2.3** ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේ දී පාලක සභාවේ විධිමත් අනුමැතියකින් තොරව අවස්ථා **03** කදී මුහුණත අගය රු. **16,329,679** ක් වූ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සඳහා රු. **14,852,534** ක් වැයකර තිබුණි.

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. **11,611,846** ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු. **7,793,718** ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. **3,818,128** ක වර්ධනයක් විය. භාණ්ඩාගාර බිල්පත් මත වූ පොලී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. **3,861,539** කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කාර්යසාධනය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ප්‍රතිලාභ සැලසීමට අර්ථසාධක අරමුදල් පිළිබඳ පාලනය, පරිශීලනය හා කළමනාකරණය සඳහා **1981** අංක

74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත යටතේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලීය අර්ථසාධක අරමුදල පිහිටුවා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ දී අරමුදල විසින් දායක ගිණුම්වලට බැර කරන ලද පොලිය රු. 11,608,963 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු. 7,798,968 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රතිලාභ ප්‍රමාණය සියයට 49 ක වර්ධනයක් පවතින බව නිරීක්ෂණය විය. ගෙවන ලද ප්‍රතිලාභය අරමුදලේ ආයෝජන ආදායම මත තීරණය වන අතර ඒ අනුව වර්ෂයෙන් වර්ෂයට එය විචලනය වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

අර්ථසාධක අරමුදලේ පරිපාලනය හා කළමනාකරණය සඳහා නියෝග සෑදීමේ බලය 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 27 වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ පාලක සභාවට පවරා ඇති අතර, ඒ අනුව අරමුදලේ දායකයින්ට දායක ගිණුමේ ශේෂයෙන් සියයට 60 ක් පොලී රහිතව වසර 10 කින් ආපසු ගෙවීමේ කාලයක් සඳහා ණයට දීම සඳහා වූ නියෝගයක් සකස් කරගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 44,538,828 ක් සේවකයන් 88 දෙනෙකුට ණය ලෙස ලබා දී තිබුණු අතර ඒ සඳහා කිසිදු පොලියක් අය නොකිරීම හේතුවෙන් අරමුදලේ වර්ධනයට එය අහිතකර ලෙස බලපා තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවධානයට යොමු කරන ලද අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) පරිපාලන වියදම් අන්තර්ග්‍රහණය කිරීම | අරමුදලේ මෙහෙයුම් කටයුතු බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන නමුත් ඒ සඳහා සාධාරණ වූ පරිපාලන වියදමක් අරමුදල වෙනුවෙන් අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) සේවක ණය පාලනය | සේවක ණය සීමා නොකිරීම මත අරමුදලේ වර්ධනයට බලපෑම් ඇතිවීම. |